ප්‍රධාන ලේකම් කාර්යාලය - වයඹ පළාත
பிரதான செயலாளர் அலுவலகம் - வடமேல் மாகாணம்
Chief Secretary's Office – North Western Province

පළාත් සභා කාර්යාල සංකීර්ණය, කුරුණෑගල - மாகாண சபை அலுவலகத் தொகுதி, குருநாகல் - Provincial Council Office Complex, Kurunegala.

මූල්‍ය කළමනාකරණ අංශය
நிதி முகாமைத்துவ பிரிவு
Financial Management Division

මගේ අංකය / எனது இலக்கம் / My No: NWP/CS/F/32/01/IN.AU.GU
ඔබේ අංකය / உமது இலக்கம் / Your No:
දිනය / திகதி / Date: 2023.04.05.02

සියලුම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන් සහ ගණන්දීමේ නිලධාරීන් වෙත.

## අභ්‍යන්තර විගණන මාර්ගෝපදේශ.

උක්ත කරුණට අදාලව කළමනාකරණ විගණන අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක; DMA/01-2019 හා 2019.01.12 දිනැතිව නිකුත් කර ඇති කළමනාකරණ විගණන චක්‍රලේඛයට අනුව වයඹ පළාත් සභාවට උචිත පරිදි සංශෝධනය කර නිකුත් කරන ලද අංක :NWP/CS/F/4/14/M-AUDIT හා 2020.02.27 දිනැති අභ්‍යන්තර විගණන මාර්ගෝපදේශය හා බැඳේ.

02). ඒ අනුව චක්‍රලේඛය මගින් ප්‍රාග්ධන ව්‍යාපෘතිවල ප්‍රගතිය සමාලෝචනය සඳහා හඳුන්වා දෙන ලද ඇමුණුම 05 යටතේ වන ආකෘතිය 01 සංශෝධනය කරනු ලබන අතර එකී සංශෝධන සහිත ආකෘති අංක 01 ප්‍රාග්ධන ව්‍යාපෘතිවල ප්‍රගතිය සමාලෝචනය සඳහා භාවිතයට ගන්නා ලෙස කාරුණිකව දන්වමි.

03). මෙම ආකෘතිය සංශෝධනය කිරීමේ මූලික අරමුණ වනුයේ එක් එක් ප්‍රාග්ධන වියදම් සඳහා වන ක්‍රියාකාරී සැලැස්ම හා ඒ සඳහා වූ ප්‍රසම්පාදන සැලැස්ම සමග සත්‍ය භෞතික හා මූල්‍ය ප්‍රගතිය මැන බැලීමය. ඒ අනුව ආකෘතිය සම්පූර්ණ කිරීමේදී සෑම ප්‍රාග්ධන වියදමක් සඳහාම වර්ෂය ආරම්භයේ පිළියෙල කළ ක්‍රියාකාරී සැලැස්ම හා ඊට අදාල ප්‍රසම්පාදන සැලැස්ම ඇතුළත් කල යුතුය. ඉන් අනතුරුව එකී ප්‍රාග්ධන වියදමට අදාලව භෞතික හා මූල්‍ය ප්‍රගතිය දැක්විය යුතු වේ.

04). එහි දි පළාත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු වල විගණන හා කළමනාකරණ කමිටු කැඳවනු ලබන කැඳවුම් කරුගේ ප්‍රධාන වගකීමක් වනුයේ විගණන කළමනාකරණ කමිටු රැස්වීමට ප්‍රථම අදාල ආයතන වලින් නිවැරදි හා සම්පූර්ණ කරන ලද තොරතුරු මෙම ආකෘතිය පත්‍රයට අනුව ලබාගෙන විගණන හා කළමනාකරණ කමිටුවට ඉදිරිපත් කිරීමයි. ප්‍රාග්ධන වියදම් හා පුනරාවර්තන වියදම් වලට සම්බන්ධ මූල්‍ය ප්‍රගතිය වාර්තා කිරීම සඳහා වන ආකෘතිය කළමනාකරණ විගණන දෙපාර්තමේන්තු වෙබ් අඩවියෙන් භාගත කර ගත හැකි අතර, එය අදාල ආයතන වලට සුදුසු පරිදි සකස් කර ගත යුතුය. (www.treasure.gov.lk)

05). ඒ අනුව සියලුම දෙපාර්තමේන්තු ඒ සඳහා වන ආකෘතිය යාවත්කාලීන කර කාර්තු පදනමින් පවත්වනු ලබන විගණන හා කළමනාකරණ කමිටුවට ඉදිරිපත් කිරීමටත්, පළාත් අමාත්‍යාංශ සම්බන්ධ වනවිට එකී අමාත්‍යාංශයේ ප්‍රගති සමාලෝචන වාර්තාවට ඊට අයත් දෙපාර්තමේන්තු සහ ව්‍යවස්ථාපිත ආයතන වල ප්‍රගතියද ඇතුළත් කර සකස් කරන ලද ප්‍රගති සමාලෝචන වාර්තාව පළාත් අමාත්‍යාංශයේ විගණන හා කළමනාකරණ කමිටුවට ඉදිරිපත් කිරීමට කටයුතු කරන ලෙස කාරුණිකව දන්වමි. මේ පිළිබඳව යම් පැහැදිලි කර ගැනීමක් අවශ්‍ය වන්නේ නම් ඒ සඳහා පළාත් භාණ්ඩාගාරයේ අධ්‍යක්ෂ මුදල් හා ආදායම් අමතා (037-2223332) ලබා ගත හැක.

රංජිත් ආරියරත්න,
ප්‍රධාන ලේකම්,
(වයඹ පළාත)

පිටපත : පළාත් අභ්‍යන්තර විගණන අධ්‍යක්ෂ - කා.දැ.පි

අධ්‍යක්ෂ (මුදල් හා ආදායම්) / பணிப்பாளர் (நிதி மற்றும் வருமானம்) / Director (Finance & Revenue) — Tel 037-2223332, Fax 037-2223332, e-mail: dirafinrevnwpc@gmail.com
ප්‍රධාන ලේකම් කාර්යාලය / பிரதான செயலாளர் அலுவலகம் / Chief Secretary's Office — Tel 037-2231769-72, Fax 037-2222234, e-mail csnwp@sltnet.lk, Web site www.cs.nw.gov.lk
නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මූල්‍ය කළමනාකරණ) / பிரதி பிரதான செயலாளர் (நிதி முகாமைத்துவம்) / Deputy Chief Secretary (Financial Managment) — Tel 037-2228128, Fax 037-2223731, e-mail dcsfinnwpc@gmail.com